# සහභාගිත්ව සහතිකකරණ ක්‍රමවේදය පිළිබඳ අත්පොත

# හැඳින්වීම

ඔක්ස්ෆෑම් ඕස්ට්‍රේලියා ආයතනය වරල්ඩ්විෂන් ලංකා ආයතනය සහ ජනතාක්ෂණ යන ආයතනයන්ගේ එකතුව යටතේ ක්‍රියාත්මක වන බ්‍රිජ් මාර්කට් ව්‍යාපෘතියේ සහභාගිත්වය සහතිකරණය පිළිබඳ වැඩසටහන වෙනුවෙන් ලංකා කාබනික කෘෂිකර්ම ව්‍යාපාරයේ දායකත්වය සමග පළ කරනු ලබන මෙම පොත් පිංච ඔබ අතට පත් වනනේ ඔබගේ කණ්ඩායම්වල ධාරිතාවය වර්ධනය කර ගැනීම සඳහා මෙම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ (HORDI) උපදේශකත්වය යටතේ පවතින AFACI, ANSOFT ව්‍යාපෘතිය යටතේ සකස් කොට ඇති පත්‍රිකා කට්ටල උපයෝගී කරගෙන පිලියෙල කොට ඇති මෙහි ඉහත කිසිදු ආයතනයක අදහස් පිළිබිඹු නොවන අතර සහභාගීත්ව සහතිකකරණය ශ්‍රී ලංකාව තුළ ජනප්‍රිය කරලීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අනෙකුත් ආයතනවල සහයෝගය සහිතව කරගෙන යනු ලබන ක්‍රියාකාරකම් අතරට එක්වූ තවත් එක් කුඩා පරිශ්‍රමයකි.

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදන කර්තවයයේ ප්‍රමුඛයා වන අතර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයෙහිලා මහත්වූ කාර්යයන් ඉටු කරනු ලබන ආයතනයක් වන්නේය. එබැවින්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ආහාර නිෂ්පාදනයේ ද නිරත එක් එක් විශේෂ ගොවි කණ්ඩායම් සඳහා යොදා ගැනෙන තාක්ෂණික පද්ධතියන් නිර්මාණය කිරීමේලා අවශ්‍ය ක්‍රියාමාර්යන් ගනී. කාබනික ආහාර නිෂ්පාදන කාර්යයේදී යොදාගැනීමට අත්‍යවශ්‍ය වන කාබනික සහතිකකරණ වැඩ පිළිබඳ මෙම දෙපාර්තමේන්තුව මූලිකත්වයෙන් කුඩා පරිමාණයේ ගොවි ජනතාව වෙත හඳුන්වා දීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි කාබනික නිෂ්පාදයන් සඳහා අවශ්‍ය ප්‍රමිතකරණයන් ලබාදීම මෙකී කුඩා ගොවි කණ්ඩායම් වල ක්‍රය ශක්තිය වැඩිකිරීමට හේතුවක් වන බව මගේ විශ්වාසය වේ. මෙයට අමතරව මෙහි ක්‍රියාදාමය ශ්‍රී ලංකාව තුළ කාබනික ආහාරවල සුලභතාවය වැඩිකිරීමට හේතුවනු ඇතැයි විශ්වාස කරන අතර කාබනික වගා ක්‍රමය ප්‍රචලිත කිරීමේ වැඩසටහන සඳහා සුභපතමි.

ආචාර්ය ආර්. ආර්. ඒ. විජේකෝන්
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

# පටුන

සහභාගිත්ව සහතිකකරණ ක්‍රමවේදය හැදින්වීම

සහභාගිත්ව සහතිකකරණ ක්‍රමවේදය - සැලැස්ම

ජාතික කමිටුව

ජාතික කමිටුව සතු කාර්ය භාරයන්

ජාතික කමිටුව සතු ලේඛණ

ප්‍රාදේශීය කණ්ඩායම

ප්‍රාදේශීය කමිටුව සතු කාර්ය භාරයන්

ප්‍රාදේශීය කමිටුව සතු ලේඛණ

ග්‍රාමීය කණ්ඩායම

ග්‍රාමීය කණ්ඩායම සතු කාර්ය භාරයන්

ග්‍රාමීය කණ්ඩායමේ සාමාජිකයා සතු ලේඛණ

ශ්‍රී ලංකාවේ කාබනික බෝග නිෂ්පාදන ක්‍රියාවලිය, පරිසරය හා
යෙදවුම් කළමණාකරණය සඳහා වන සහතිකකරණ ක්‍රමවේද ප්‍රමිතින්
කාබනික පොහොර සඳහා යොදාගත හැකි ද්‍රව්‍ය

කාබනික පොහොර සඳහා යොදාගත රෝග හා පළිබෝධ පාලනය සඳහා
යොදා ගත හැකි ද්‍රව්‍ය හැකි ද්‍රව්‍ය

කාබනික සහතිකකරණ ග්‍රාමීය කණ්ඩායමට ඇතුලත්
වීම සඳහා අයදුම් පත්‍රය ප්‍රාදේශීය කමිටුවෙහි ලියාපදිංචි වීම සඳහා ඇතුළත් වීමේ පත්‍රිකාව

ගොවිපල ඉතිහාසය

කාබනික ගොවි පොරොන්දුව

ග්‍රාමීය කණ්ඩායමේ රැස්වීම් පැවැත්වීමේ සහ පැමිණීමේ ආකෘති පත්‍රය

ග්‍රාමීය කණ්ඩායමේ රැස්වීම් සඳහා සාමාජික සහභාගිත්වය

ඇගයුම් කරුවන්ට උපදෙස්

ග්‍රාමීය කණ්ඩායමේ සාරාංශ පත්‍රය

සහතිකකරණය පිළිබඳ තීරණ

කාබනික පොරොන්දු කඩ කිරීම පිළිබඳව ගනු ලබන ක්‍රියා මාර්ග
(සම්බාධක/දණ්ඩන)

# සහභාගිත්ව සහතිකකරණ ක්‍රමවේදය හැඳින්වීම

කාබනික සහභාගිත්ව සහතිකකරණ ක්‍රමවේදය යනු කාබනික ප්‍රමිතීන්ට අනුකූලව සිදුකරන වගාවන් සඳහා මූලික වශයෙන් වගා කරුවන් සහ පාරිභෝගිකයින් අතර ඇතිවන අන්‍යෝන්‍ය විශ්වාසය පදනම් කර ගත් නිෂ්පාදන සහතික කිරීමේ ක්‍රියාවලියකි. මෙම ක්‍රමවේදය තුළින් කුඩා පරිමාණ කාබනික එළවළු වගා කරුවන්ගේ නිෂ්පාදන වලට සාධාරණ වටිනාකමක් ලබා දීම මගින් කාබනික වගාව ප්‍රචලිත කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලික අරමුණ වේ. කාබනික වගාව සඳහා වලංගු සහතිකයක් ලබා ගැනීමට සුළු වගා කරුවන්ට දැරිය යුතු වන විශාල පිරිවැය අවම කිරීම තවත් එක් අරමුණකි.

වගාකරුවන්, සංස්ලේශිත පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ද්‍රව්‍ය යෙදීමකින් තොරව පරිසරය සමග තුලනාත්මකව තම වගාවන් පවත්වා ගෙන යනු ලබන අතරල නිෂ්පාදන ක්‍රමවේදයෙහි ඇති විවෘත සහ විනිවිද භාවය නිසා පාරිභෝගිකයා තුළ විශ්වාසය ගොඩ නැගේ. එසේම මෙම ක්‍රියාවලියට සහභාගිවන්නන්ට නිෂ්පාදන සහතික කිරීම සඳහා වගකීම සහ බලය ලැබීම නිසා සමාජ සාධාරණීයත්වය-ක් ඉටුවේ. දීර්ඝ කාලීනව කාබනික වගාවට යොමු වීම නිසා පරිසරයේ තුලනාත්මක බව වැඩි දියුණු වීමෙන්, වගාව සම්බන්ධයෙන් පැන නගින ගැටළුකාරී තත්ත්වයන් අඩුවීම නිසා ආර්ථිකල සමාජීය හා පරිසරාත්මක තිරසාර බව ලඟා කර ගැනීමට සහභාගිත්ව සහතිකකරණ ක්‍රමවේදය ඉවහල් වේ.

# සහභාගිත්ව සහතිකකරණ ක්‍රමවේදය- සැලැස්ම

සහභාගිත්ව සහතිකකරණ ක්‍රමවේදයෙහි අරටුව වන්නේ ග්‍රාමීය කණ්ඩායමය. ග්‍රාමීය කණ්ඩායම් කිහිපයක් හෝ සමූහයක් ලියාපදිංචි කිරීමල ප්‍රාදේශීය කමිටුවක් මගින් සිදු කරයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රධාන කොට ගත් ජාතික කමිටුව මගින් ප්‍රාදේශිය කමිටුව හරහා කාබනිකකරණයට අදාළ සහතික ලබාදීම සඳහා අවශ්‍ය මූලික ක්‍රමවේදය සැළසුම් කරනු ලබයි.




රූප සටහන 1. සහභාගිත්ව සහතිකකරණ ක්‍රමවේදය- සැලැස්ම

# ජාතික කමිටුව

අධ්‍යක්ෂ ජනරාල්- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ-උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය

කෘෂිකර්ම පර්යේෂණ ආයතන වල නම් කරන ලද පර්යේෂණ නිලධාරීන්

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව-නම් කරන ලද නිලධාරීන්

උපදේශකයන්-විශ්ව විද්‍යාල වැනි අධ්‍යාපන ආයතන වල හඳුනා ගත් නිලධාරින්

පහසුකම් සලසන්නන්- පූර්ව කාබනික සහතිකකරණ ක්‍රමවේදය පිළිබඳ මූලික දැනුම සහිත පුද්ගලයින්

වෙනත් කාබනික කණ්ඩායම් වල නිලධාරින්

මනා කෘෂිකාර්මික භාවිතයන් (GAP) පිළිබඳ ව්‍යාපෘතියෙහි නිලධාරීන්

ශ්‍රී ලංකාව තුළ සුළු පරිමාණ කාබනික කෘෂිකර්මාන්තයේ යෙදෙන නිෂ්පාදකයින් අතර අන්තර් සම්බන්ධතා ඇති කරමින් නිෂ්පාදන සඳහා නියම වටිනාකමක් ලබා දීමට අවශ්‍ය ප්‍රමිතීන් හා අනෙකුත් ප්‍රතිපත්ති ගොඩ නැංවීම ජාතික කමිටුවේ මූලික කාර්යභාරය වේ. කාබනික නිෂ්පාදන ක්‍රියාවලිය ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක වීම පිළිබඳව පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ප්‍රාදේශීය කමිටු වලට හඳුන්වා දීම ද ජාතික කමිටුව සතු වගකීමකි.

# ජාතික කමිටුව සතු කාර්ය භාරයන්

- ජාතික කාබනික ප්‍රමිතීන් නිර්මාණය කිරීම
- කාබනික යෙදවුම් පිළිබඳ තීරණ ගැනීම
- ග්‍රාමීය කමිටුවට සාමාජිකයින් බඳවා ගැනීම සඳහා අවශ්‍යතා තීරණය කිරීම
- කාබනික සහතිකකරණ ක්‍රියාවලිය සකස් කිරීම
- අවශ්‍ය ලේබන නිර්මාණය කිරීම
- රෙගුලාසි උල්ලංඝනය කිරීමට අදාළ සම්බාධක තීරණය කිරීම
- කාබනික ක්‍රමවේදය හඳුන්වා දීම, දැනුවත් කිරීම හා ව්‍යාප්ත කිරම සඳහා අවශ්‍යතා සම්පාදනය
    - o වැඩමුළුල සම්මන්ත්‍රණ, ක්ෂේත්‍ර චාරිකා යනාදිය සංවිධානය කිරීම තුළින් ගොවීන්ගේ ආකල්ප හා හැකියාවන් වර්ධනය
    - o පාරිභෝගිකයින් දැනුවත් කිරීම
    - o නිෂ්පාදන අලෙවිය හා ප්‍රචාරණය සඳහා ක්‍රියා කිරීම
- නිෂ්පාදන අලෙවිය සඳහා සම්බන්ධතා ඇති කිරීම
- ගොවි කණ්ඩායම් ලියාපදිංචි කිරීම සහ සහතිකකරණය පිළිබඳ තීරණ ගැනීම
    - o නිෂ්පාදන සඳහා නිකුත් කරන ලේබල සහ ලාංඡන සකස් කිරීම හා නිකුත් කිරීම පිළිබඳ තීරණ ගැනීම සහ වෙළඳපලෙහි පවතින ලේබල සහ ලාංඡන සහිත නිෂ්පාදන නිවැරදිව හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයන් සකස් කිරීම
    - o වාර්ෂිකව ලබාදෙන සහතික පිළිබඳ සමාලෝචන සිදු කිරීම
- ප්‍රමිතීන් කඩ කිරීම පිළිබඳ පැමිණිලි හා විමර්ශන විශ්ලේෂණය
- සහතිකකරණය සඳහා ප්‍රාදේශීය කමිටුවට උපදෙස් ලබාදීම
- ප්‍රාදේශීය කමිටු ලියාපදිංචි කිරීම
- වෙළඳපල හා ගොවිපළ නියැදි පරීක්ෂාව සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම

# ජාතික කමිටුව සතු ලේඛණ

- ප්‍රමිතීන් (සවිස්තරාත්මක සහ සංක්ෂිප්ත)
- දත්ත ගොනු (ප්‍රාදේශීය කමිටු විස්තර, ගොවි සාමාජික ලැයිස්තුල සහතිකකරණ තත්වල නිෂ්පාදනල ගොවිපළ ලැයිස්තුල බෝගල ගොවිපළ ඉතිහාසල වගා වපසරියන් වැනි විස්තර)
- කාබනික ක්‍රමවේදය හා ක්‍රියාකාරිත්වය පිළිබඳ අත්පොත
    - ඉල්ලුම්පත්‍ර
    - කාබනික සහතිකකරණ ක්‍රියාවලිය (මුද්‍රාව ලබා ගන්නා ආකාරය සහ භාවිතය)
    - නීති තඩකිරීමේදී පනවන සම්බාධක
    - ඇගයුම් පත්‍ර
- උපදේශකයින් සඳහා තාක්ෂණ සටහන්

# ප්‍රාදේශීය කණ්ඩායම

කෘෂිකර්ම පළාත් අධ්‍යක්ෂ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් නම් කරන ලද ව්‍යාප්ති නිලධාරින්

ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථාන වල ආයතන ප්‍රධානීන් විසින් නම් කරන ලද නිලධාරින්

ප්‍රාදේශීය සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් නම් කරන ලද නිලධාරියෙක්

ග්‍රාමීය කමිටු නියෝජිතයින්

රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශ

වෙනත්-

කාබනික වගාව පිළිබඳව උනන්දුවක් දක්වන ප්‍රදේශ වාසීන්

වෙළඳ ව්‍යාපාරිකයින්

වෙනත් වෘත්තිකයින්

පූජ්‍ය පක්ෂය

කණ්ඩායම් නායක- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජිත නිලධාරියෙක්

ප්‍රාදේශීය වශයෙන් කාබනික ගොවිතැනෙහි යෙදෙන සුළු පරිමාණ ග්‍රාමීය කණ්ඩායම් ඒකරාශි කරල සාමාන්‍ය ජනතාව උදෙසා අඛණ්ඩ දේශීය කාබනික එළවළු වෙළඳපලක් නිර්මාණය කිරීම ප්‍රාදේශීය කමිටුව, මූලික අභිප්‍රාය වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කාබනික නිෂ්පාදන සඳහා නිකුත් කරනු ලබන ලාංඡන සහ ලේබල වෙළඳපල තුළ සංසරණය නිවැරදිව සිදුවේදැයි සුපරික්ෂා වීම ප්‍රාදේශීය කමිටුවක් සතු භාරදූර කාර්යයක් වේ.

# ප්‍රාදේශීය කමිටුව සතු කාර්ය භාරයන්

- ග්‍රාමීය කණ්ඩායම් ලියාපදිංචි කිරීම
- ග්‍රාමීය කණ්ඩායම් සාමාජිකයින්ගේ වගා බිම්වල පරිවර්තන කාලය සහතික කිරීම
- කණ්ඩායම් සාමාජිකයින් සඳහා පුහුණු කටයුතු සිදු කිරීම
- ඇගයුම් කටයුතු සඳහා සහභාගි වීම
- අහඹු පරීක්ෂා සඳහා වෙළඳපල සහ ගොවිපල නියැදි ලබා ගැනීම
- ඇගයුම් සාරාංශ පත්‍ර විශ්ලේෂණය කිරීම
- මාස 6ට වරක් (සෑම වසරකම ජනවාරි සහ ජූලි) කාබනික සහතිකකරණය
- සම්බාධක/ දණ්ඩන පැනවීම
- ප්‍රාදේශීය අලෙවිකරණය සඳහා සහාය වීම
- කාබනික ක්‍රමවේදය පිළිබඳව ගොවීන් සහ පාරිභෝගිකයින් දැනුවත් කිරීම
- කාබනික ක්‍රමවේදය ප්‍රචලිත කිරීම
- පැමිණිලි කටයුතු විමර්ශනය සහ අවශ්‍ය විටෙක ජාතික කමිටුවේ උපදෙස් ලබා ගැනීම
- ලාංඡනල ලේබල සහ මුද්‍රා නිකුත් කිරීම හා නිවැරදි භාවිතය පිළිබඳව පරීක්ෂා කිරීම
- මාස 2-4 ට වරක් සහ වෙනත් අවශ්‍ය අවස්ථා වල රැස්වීම් පැවැත්වීම
- ග්‍රාමීය කණ්ඩායම් වල නව නිපැයුම් පිළිබඳව සොයා බැලීම සහ ජාතික කමිටුව දැනුවත් කර ඒ පිළිබඳ නිර්දේශයක් ලබා ගැනීම

# ප්‍රාදේශීය කම්ටුව සතු ලේඛණ

- ග්‍රාමීය කණ්ඩායම් ලැයිස්තු
- ග්‍රාමීය කම්ටුවල නිෂ්පාදන සහ අස්වනු පිළිබඳ විස්තර
- වගා බිම් සහ වගා ඉතිහාස පිළිබඳ විස්තර
- ප්‍රාදේශීය කම්ටු රැස්වීම්ල වැඩමුළුල ක්ෂේත්‍ර දින හා වෙනත් කටයුතු සඳහා සහභාගි වීමේ ලේඛණ සහ රැස්වීම් වාර්තා
- ග්‍රාමීය කණ්ඩායම් ඇගයුම් සාරාංශ
- පැමිණිලි හා දණ්ඩන ලේඛන
- වෙළඳසැල් විස්තර
- ජාතික කම්ටුව මගින් නිකුත් කරන පත්‍රිකා

# ග්‍රාමීය කණ්ඩායම

- කාබනික කෘෂි නිෂ්පාදකයින්
- ග්‍රාමීය මට්ටමින් හඳුනා ගන්නා ලද දැනුමැති පුද්ගලයින්
- පාරිභෝගිකයින්

සමස්ථ කාබනික සහතිකකරණ ක්‍රියාදාමයේ ප්‍රධාන ක්‍රියාවලිය සිදු කරන්නේ ග්‍රාමීය කණ්ඩායම විසිනි. නිෂ්පාදන ප්‍රමිතියානුකූලව නිපදවීම ගබඩාකරණය ප්‍රවාහණය සහ අලෙවිය සිදු කිරීම ද නිසි ප්‍රමිතිය රැක ගැනීම උදෙසා ඇගයුම් පරීක්ෂා සඳහා සහාය දැක්වීමද කණ්ඩායම් සාමාජිකයින් සතු වගකීමකි.

# ග්‍රාමීය කණ්ඩායම සතු කාර්ය භාරයන්

- කාබනික ප්‍රමිතීන්ට අනුකූලව වගා කිරීමට ගබඩා කිරීමට ප්‍රවාහණය හා අලෙවිය
- පාරිභෝගිකයින් සහ ඇගයුම් පරික්ෂකයින්ට විනිවිද භාවයෙන් යුතුව සහයෝගිතාවය දැක්වීම
- අවශ්‍ය විටකදී නොපැකිළවම නිෂ්පාදන සහ යෙදවුම් පිළිබඳ වාර්තා පෙන්වීම
- සෑම මාසයකට වරක් කණ්ඩායම් හමුවක් පැවැත්වීම
- රැස්වීම් වාර්තා තබා ගැනීම හා ඒවාට සහභාගි වීම
- මාසික රැස්වීම් සඳහා කණ්ඩායම් නායකයෙක් සහ කාරක සභාවක් පත් කර ගැනීම
- ගොවිපළ වල ඇගයුම් කටයුතු සාර්ථකව කර ගැනීම සඳහා සියළු සහාය දැක්වීම
- ක්ෂේත්‍ර දින පැවැත්වීම
- කණ්ඩායම් සාමාජිකයින්ටම අවශ්‍ය විටෙක උපදෙස් ලබාදීමට ගැටළු සාකච්ඡා කිරීම සහ කණ්ඩායමෙහි දියුණුව උදෙසා සාමූහිකව හා විශ්වාසවන්තව කටයුතු කිරීම
- නව සොයාගැනීම් පිළිබඳව ප්‍රාදේශීය කණ්ඩායමට වාර්තා කිරීම හා අනෙකුත් සාමාජිකයින් දැනුවත් කිරීම

# ග්‍රාමීය කණ්ඩායමේ සාමාජිකයා සතු ලේඛණ

- කාබනික ප්‍රමිතීන්
- ඇගයුම් කරුවන්ට උපදෙස් ලේඛණය
- ග්‍රාමීය කණ්ඩායමේ සහ සාමාජිකයාගේ කාර්යභාරය
- කණ්ඩායමට ඇතුළත් වීම සදහා ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රයෙහි පිටපතක්
- ගොවිපළ ඉතිහාසය පිළිබඳව ඉදිරිපත් කළ ලේඛණයෙහි පිටපතක්
- ගොවිපළ ඇගයුම් පත්‍රයෙහි පිටපතක්
- ප්‍රමිතීන් කඩ කිරීම පිළිබඳව දණ්ඩන ලේඛණ
- කාබනික ගොවි පොරොන්දු පත්‍රිකාවෙහි පිටපතක්
- අනුමත කාබනික යෙදවුම් පත්‍රිකාව
- ආරම්භයේ සිට ක්‍රමානුකූලව පවත්වා ගෙන යනු ලබන වගාළ යෙදවුම්ල අස්වනු සහ අලෙවි සටහන් පිළිබඳ අත්පොත

# ශ්‍රී ලංකාවේ කාබනික බෝග නිෂ්පාදන ක්‍රියාවලියල පරිසරය හා යෙදවුම් කළමණාකරණය සඳහා වන සහතිකකරණ ක්‍රමවේද ප්‍රමිතින්

1. වගා ප්‍රදේශය මාස 6ක් පමණ කාබනික බෝග නිෂ්පාදන ක්‍රියාවලියට අනුමත නොකරන ලද යෙදවුම් වලින් තොර විය යුතුය. කාබනික වගාව ආරම්භයෙන් පසු පද්ධතිය ස්ථාපනය වීම සඳහා එලවළු වාර්ෂික හා බහුවාර්ෂික බෝග මාස 6ක පරිවර්තන කාලයක් ලබා දිය යුතුය.

   වගා ඉතිහාසය අනුව අධික ලෙස කාබනික නොවන යෙදවුම් යෙදූ වගා බිමක පරිවර්තන කාලය අනුමත කිරීමට ප්‍රාදේශීය කමිටුවේ සහතිකය අවශ්‍ය වේ.

2. පෙර වසරේ පරිසරයට යොදන ලද කෘෂි රසායන සහ අනෙකුත් යෙදවුම් පිළිබඳව සලකා බැලිය යුතුය. මෙම කාලය තුලදී ගොවිපළ පරිවර්තනීය ගොවිපලක් ලෙසත් එම බෝග පරිවර්තන කාලයේ නිෂ්පාදන ලෙසත් වෙළඳ පලට හඳුන්වා දිය හැක.

3. බීජ හා රෝපණ ද්‍රව්‍ය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශල ස්වයං නිෂ්පාදනල සහතික කරන ලද කාබනික බීජල පළිබෝධනාශක මුසු නොවූ සාම්ප්‍රදායික ද්‍රව්‍ය යොදා ගත හැක. මේවා දේශිය පසල කාලගුණයල රෝග හා පළිබෝධ සඳහා වඩා ඔරොත්තු දෙන ද්‍රව්‍ය වීම වැදගත්ය.

4. රසායන ද්‍රව්‍ය වලින් ප්‍රතිකාර නොකරන ලද බීජ හා රෝපණ ද්‍රව්‍ය යොදා ගත යුතු අතර මිශ්‍ර වී ඇති රසායන ද්‍රව්‍ය හැකිතාක් දුරට ඉවත් කිරීමට පියවර ගන්න

5. ජාන වෙනස් කරන ලද රෝපණ ද්‍රව්‍ය භාවිතා කළ නොහැක

6. පාංශු සාරත්වය වැඩි කිරීම සඳහා ජෛව පොහොරල සත්ත්ව පොහොරල කොළ පොහොර හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශ වලට අනුකූලව සාදන ලද කාබනික පොහොර වැනි ද්‍රව්‍ය යොදා ගන්න

7. රෝග පළිබෝධ හා වල් වර්ග මර්ධනය සඳහා පරිසරය තත්වයන්ට ගැළපෙන බෝග වර්ග යොදා ගැනීමල බෝග මාරුව අන්තර් බෝග වගාව වැනි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමවේදයන් දල පළිබෝධකයින්ගේ ස්වභාවික සතුරන් වැඩි කර ගැනීමට අවශ්‍ය පරිසරය සැකසීමල අනුමත කරන ලද ජීවීන් මගින් පළිබෝධ පාලනය කිරීම වැනි ජෛව විද්‍යාත්මක ක්‍රම දල විවිධ උගුල් යෙදීම වැනි භෞතික ක්‍රම ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කාබනික වගාව සඳහා නිර්දේශිත අනෙකුත් ක්‍රම ද භාවිතා කළ යුතුය. රසායනික කෘමිනාශකල දිලීරනාශක හෝ වල්නාශක භාවිතා කළ නොහැක.

8. කාබනික වගා ප්‍රදේශය පැහැදිලිව වෙන් කර ගන්න. අවට වගා බිම් වලින් මිශ්‍ර විය හැකි කෘෂි රසායන සහිත පසල ජලයල සුළග සහ අනෙකුත් ද්‍රව්‍ය වලක්වා ගැනීමට ජෛව ක්‍රමල භෞතික ක්‍රමල බාධක වැට හෝ ස්වාරක්ෂක කලාප පවත්වා ගත යුතුය. ස්වාරක්ෂක කලාප සඳහා කොළ පොහොර සඳහා භාවිතා කරන සුලබ ද්‍රව්‍ය යොදා මී.1 ක පමණ පළලින් යුතුව සකසන්න.

9. පස සහ තෙතමනය සංරක්ෂණය සඳහා සමෝච්ඡ වැට, බාධක, කාණු යනාදිය පවත්වා ගත යුතුය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කර ඇති පාංශු සහ ජල සංරක්ෂණ ක්‍රම උපයෝගී කර ගන්න.

10. කෘෂි රසායන ද්‍රව්‍ය වලින් අපිරිසිදු නොවූ ජල ප්‍රභවයක් භාවිතා කරන්න.

11. පස සරුසාර කර ගත හැකි ආකාරයට සහ පරිසරය තත්වයන්ට අනුවර්තනය වන පරිදි සුදුසු බෝග සම්මිශ්‍රණයක් සහිතව රනිල බෝගල ගැඹුරට මුල් අදින බෝගල කොළ පොහොර වලට ගත හැකි බෝග යනාදිය ද මිශ්‍රිත විචිත්‍ර බෝග නිෂ්පාදන ක්‍රමවේදයක් සකසා ගන්න.

12. බෝග අවශේෂ පිළිස්සීමෙන් වැළකිය යුතුය. රෝග සහ පළිබෝධ පාලනයට අවශ්‍ය විටක පමණක් ඒ පිළිබඳව සාකච්ඡා කර නිර්දේශිත ආකාරයට සිදු කරන්න.

13. කාබනික වගාව සඳහා වෙන් කර ගත් උපකරණ කට්ටලයක් භාවිතා කරන්න. අත්‍යවශ්‍ය හේතුවක් මත එසේ කළ නොහැකි අවස්ථාවක භාවිතා කරන උපකරණ හොඳින් සෝදා පිරිසිදු කර භාවිතා කරන්න.

14. නිෂ්පාදනයේ සිට අලෙවි කිරීම දක්වා විවිධ පියවර වලදී සුදුසු නොවන දෑ සමග කළවම වීම වළක්වා ගැනීමටල එම කාර්යයන් වෙන්ව සිදු කරන්න. ගබඩාකරණයේදී සහ ප්‍රවාහනයේදී යොදා ගනු ලබන ඇසුරුම්ල උපකරණල විවිධ කෘෂි රසායනාදිය සමග මිශ්‍ර නොවිය යුතුය

15. ගබඩාකරණයේදී ආරක්ෂා කර ගැනීමට ස්වභාවිකල ශෂ්‍ය විද්‍යාත්මක හෝ ජෛව විද්‍යාත්මක ක්‍රම යොදා ගන්න.

16. වගාවල යෙදවුම් ද්‍රව්‍යල අස්වැන්නල විකිණීම හා බිල්පත් පිළිබඳව සියළු කරුණු සුදුසු පරිදි සටහන් තබා ගන්න.

ඉහත ප්‍රමිති මගින් බලාපොරොත්තු වන්නේ ජෛව විවිධත්වය සහ පරිසරය සංරක්ෂණය කිරීමයි.

## ඇමුණුම 1:

# කාබනික පොහොර සඳහා යොදාගත හැකි ද්‍රව්‍ය

| |
|---|
| **කාබනික ගොවිපළ තුළ නිපදවන ද්‍රව්‍ය** |
| හඳුනා ගත් ගොවිපල ද්‍රව්‍යල ගව සහ කුකුළු(*බ්‍රොයිලර් හැර) පොහොර වලින් නිපදවා ගත් දියර කොම්පෝස්ට් මිශ්‍රණ |
| බෝග අවශේෂ හා කොළ පොහොර (වැටහිරළ තත්තසූරිය වැනි) |
| පිදුරු සහ අනෙකුත් වසුන් |
| **කාබනික ගොවිපලින් පිටත නිපදවන ද්‍රව්‍ය** |
| කල් තබාගන්නා ද්‍රව්‍ය නොයෙදූ ඉවත් කරනු ලබන මාළු කොටස් |
| කුරුළු මළ ද්‍රව්‍ය |
| කාබනික ආහාර කර්මාන්තශාලා වල අතුරු නිෂ්පාදන වලින් සැකසූ කොම්පෝස්ට් |
| රසායන ද්‍රව්‍ය වලින් ප්‍රතිකාර නොකරන ලද දැව වලින් ලබාගත් ලී කුඩු හා ලී පතුරු |
| රසායන ද්‍රව්‍ය වලින් ප්‍රතිකාර නොකරන ලද කොහු බත් සහ පොල් ලෙලි |
| කොම්පෝස්ට් කරන ලද තේ කුඩු |
| ගැඩවිලි පොහොර |
| දැව අඟුරු/ ජෛව අඟුරු |
| බිම්මල් වගාවෙන් ඉවත ලන ප්‍රතිකාර නොකරන ලද ද්‍රව්‍ය වලින් සැකසූ කොම්පෝස්ට් |
| නිවසින් ඉවත ලන කාබනික ද්‍රව්‍ය වලින් සැකසූ කොම්පෝස්ට් |
| බෝග අවශේෂ වලින් සැකසූ කොම්පෝස්ට් |
| පාම්ල පොල් සහ කොකෝවා වල අතුරු නිෂ්පාදන (ලෙලිල තෙල් කම්හල් වලින් පිට කරන අපවාහ ද්‍රව්‍ය) |
| කාබනික අමුද්‍රව්‍ය සැකසුම් කම්හල් වල අතුරු නිෂ්පාදන |
| ස්වභාවික ඛනිජ |
| ගල් කුඩු (මයිකාල ෆෙල්ස්පාර් වැනි) |
| ලුණු |
| දැව අළු (රසායන ද්‍රව්‍ය වලින් ප්‍රතිකාර නොකරන ලද දැව හා පොල් ගසෙහි කොටස්) |
| ජිප්සම් (කැල්සියම් සල්ෆේට් |
| මැග්නීසියම් සහිත පාෂාණ (කීසරයිට්) |
| මැටි |
| ඩොලමයිට් |
| අළු හුණු |
| ෆොස්ෆේට් පාෂාණ |
| **දේශීය අමුද්‍රව්‍ය වලින් සැකසූ ක්ෂුද්‍ර ජීවී නිෂ්පාදන** |
| දේශීය බැක්ටීරියා වලින් සෑදූ ජෛව පෙොහොර |
| අඳුකොළ වැනි දේශීය ජෛවගති මිශ්‍රණ |
| පැළැටි සම්මිශ්‍රණ හා ශාක සාර (මුහුදු පැළැටි හැර) |

## ඇමුණුම 2:

# කාබනික පොහොර සඳහා යොදාගත රෝග හා පළිබෝධ පාලනය සඳහා යොදා ගත හැකි ද්‍රව්‍ය හැකි ද්‍රව්‍ය

| |
|---|
| ශාක හා සත්ත්ව සම්භවයක් සහිත ද්‍රව්‍ය |
| ශාක සාර (කොහොඹල අනෝදා ඇට වැනි) |
| ලුණු සහ ලුණු වතුර (නිර්දේශිත ප්‍රමාණ) |
| අළුහුණු / කාබනිකෘත ජලය (සෝඩා) |
| ඛනිජ කුඩු (සිලිකා වැනි) |
| ස්වභාවික තෙල් වර්ග |
| සෝඩියම් බයිකාබනේට් |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුමත ජෛව පළිබෝධනාශක |
| පරපෝෂිතයින් සහ විලෝපිකයින් |
| කාබන් ඩයොක්සයිඩ් |
| මෘදු සබන් (පොටෑසියම් සබන්) |
| ඖෂධමය ජෛව ගතික කෘෂිකාර්මික වත්පිළිවෙත් |
| භෞතික පාලන ක්‍රම (යාන්ත්‍රික උගුල්ල ආලෝක උගුල්ල ඇලෙන උගුල්ල ෆෙරෝමෝන උගුල්) |
| වසුන් සහ දැල් |

# ඇමුණුම 3:

## කාබනික සහතිකකරණ ග්‍රාමීය කණ්ඩායමට ඇතුලත් වීම සඳහා අයදුම් පත්‍රය

කණ්ඩායම් නායකල

කාබනික ග්‍රාමීය කණ්ඩායම,

අංකය:

ගම:

දිස්ත්‍රික්කය:

මහත්මයාණෙනිල

කාබනික ප්‍රමිතින් යටතේ කාබනික එළවළු වගාව සඳහා වන සහතිකකරණ වැඩසටහනට දායක වෙමින් ඔබගේ ග්‍රාමීය කණ්ඩායමේ සාමාජිකයෙක් වීමට කැමැත්තෙමි. මාගේ පවුලල ගොවිපල නිෂ්පාදන ඉතිහාසය හා ගොවිපල යෙදවුම් පිළිබඳ විස්තර සහිත ආකෘති පත්‍රය මේ සමග අමුණා ඇත. කාබනික ප්‍රමිතීන් සහ ග්‍රාමීය කණ්ඩායමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අත්පොත ලබා ගතිමි.

කණ්ඩායම් රැස්වීම් වලට සහභාගි වීමල ක්ෂේත්‍ර යුහුණු වැඩසටහන් වලට සහභාගි වීම සහ අනෙකුත් සාමාජිකයින්ගේ ගොවිපල ඇගයුම් සඳහා සහභාගි විම වැනි කණ්ඩායමට අයත් කාර්යයන් සඳහා මම දායක වෙමි.

කාබනික සහතිකකරණයට සම්බන්ධ ප්‍රමිතීන් හා සීමාවන් පිළිබඳ කොන්දේසි පිළිපදිමි. කණ්ඩායමේ සමූහ තීරණ වලට එකග වෙමි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාබනික ගොවි පොරොන්දුවට අත්සන් තබන අතර එය සත්‍ය වශයෙන්ම පිළිපදින බවට එකග වෙමි. දැනුවත්ව හෝ නොදැනුවත්ව මෙම පොරොන්දු උල්ලංඝනය කරන්නේ නම් ඊට එරෙහිව ප්‍රාදේශීය කමිටුව මගින් ගන්නා වූ තීරණ වලට එකග වෙමි.

ගොවියාගේ අත්සන
නම:

දිනය:
ස්ථානය:

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

ඇතුලත් වීමේ අංකය:

සඳහන් කර ඇති විස්තර පරීක්ෂා කළ අතර ඒවා ප්‍රමාණවත්ය/ ප්‍රමාණවත් නොවේ

ග්‍රාමීය කණ්ඩායමේ කාරක මණ්ඩලයේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදි.

කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස නො/ පිළිගතිමි සාමාජිකත්ව සංකේතය:

ග්‍රාමීය කණ්ඩායම් නායකයාගේ අත්සන:

## ඇමුණුම 4:

## ප්‍රාදේශීය කමිටුවෙහි ලියාපදිංචි වීම සඳහා ඇතුළත් වීමේ පත්‍රිකාව

ග්‍රාමීය කණ්ඩායම:

ලිපිනය:

ප්‍රාදේශීය කමිටු සභාපති

ප්‍රාදේශීය කමිටුව

______________________

මහත්මයාණෙනි,

අපගේ________________ ග්‍රාමීය කණ්ඩායමල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාබනික සහතිකකරණය සඳහා ________________ ප්‍රාදේශීය කමිටුවෙහි ලියාපදිංචි වීමට කැමැත්තෙමු. දැනට අපගේ කණ්ඩායමේ සාමාජික සංඛ්‍යාව_____ක් පමණ වේ. කාබනික සහතිකකරණය හා සම්බන්ධ සියළු කොන්දේසි පිළිපැදීමට කණ්ඩායමක් වශයෙන් අපි බැඳී සිටිමු.

කණ්ඩායම් නායකගේ නම:

අත්සන:

දිනය:

---

## ප්‍රාදේශීය කමිටුවේ ප්‍රයෝජනය සඳහා පමණි.

---

ග්‍රාමීය කණ්ඩායම:

ලිපිනය:

ඔබගේ ග්‍රාමීය කමිටුව අංක______________________ දරණ ______________________ ප්‍රාදේශීය කමිටුවේ ලියාපදිංචි කළ බවට මෙයින් දන්වා සිටිමි. ඉදිරි ලිපි ගනුදෙනු කටයුතු සඳහා පහත දක්වා ඇති සංකේත අංකය භාවිතා කරන්න.

ලියාපදිංචි සංකේත අංකය:

ප්‍රාදේශීය කමිටු සභාපතිගේ නම:

අත්සන: දිනය

## ඇමුණුම 5:

### ගොවිපල ඉතිහාසය

අයදුම්කරු හෝ කණ්ඩායමේ සාමාජිකයෙකු විසින් පුරවන්න. එක් එක් වගා බිම් කොටසකට වෙන වෙනම පුරවන්න.

1. අයදුම්කරුගේ නම:
   ලිපිනය:

   දුරකථන අංකය:

2. නිවැසියන්ගේ විස්තර:

| නම | වයස (අවු) | ස්ත්‍රී | පුරුෂ | සාමාජිකයාට ඇති සම්බන්ධය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

3. ඉඩමේ වපසරිය/ කැබලි ගණන (කැබලි කිහිපයක් ඇතිවිට වපසරිය වෙන වෙනම දක්වන්න):

4. ඉඩමේ පිහිටීම පිළිබඳ දළ රූප සටහන හඳුනා ගැනීමේ සළකුණු සහිතව (අමුණා ඇතිද යන්න):

5. කෘතිම අනුමත නොකළ යෙදවුම් අවසාන වරට යෙදූ දිනය:

7. පාංශු සහ ජල පරීක්ෂණ සිදු කර තිබේද යන්න: ඔව් නම් පිටපත් අමුණන්න

8. වගා බිමට ජලය සපයන ක්‍රම:

9. ගොවිපළෙහි භාවිතා කරන උපකරණ:

10. හරකුන්, එළුවන්, කුකුළන් වැනි සතුන් ඔබ සතුද?:

11. අනුමත නොකරන ලද ද්‍රව්‍ය සමග මිශ්‍ර වීම වළක්වා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග (ස්වාරක්ෂක කලාපල කාබනික නොවන ක්ෂේත්‍ර වලින් ගලන ජලය සමග මිශ්‍ර වීම වළක්වා ගැනීමට ගත් ක්‍රියා මාර්ග යනාදිය):

12. ගබඩා පහසුකම්:

13. අවශ්‍ය යෙදවුම් ගොවිපල තුළදී නිෂ්පාදනය කිරීම සඳහා ඇති පහසුකම් (දැනට ඇති සහ

යෝජිත):

14. නෙළීමෙන් පසු අස්වනු සකසා ගන්නා ආකාරය:

15. සම්පූර්ණ වගාබිම කාබනික වගාවට යොදවා නැතිනම් ඒ සඳහා සැලසුම් කර ඇති ආකාරය සහ පියවර වශයෙන් දක්වන්න. සම්පූර්ණ වගාබිම කාබනික වගාවට හැරවීමට ගත වන කාලය:

ඉහත සඳහන් සියළු තොරතුරු මාගේ දැනුමේ පරිදි සහ විශ්වාසයට අනුව සත්‍ය බවටත්ල යම් කරුණක් අසත්‍ය බවට ඔප්පු වුවහොත්ල ඉන්ල මා කාබනික ගොවිතැන පිලිබඳව ගොඩනගා ගත් තත්වයට හානි සිදුවිය හැකි බව දන්නා බවටත්ල මෙයින් සහතික වෙමි.

ඉල්ලුම්කරුගේ අත්සන:

ඉහත විස්තර සත්‍ය වන අතර ඉල්ලුම්කරු කෙරෙහි විශ්වාසය තැබිය හැක.

1. කණ්ඩායම් සාමාජිකයාගේ නම: අත්සන:

2. කණ්ඩායම් සාමාජිකයාගේ නම: අත්සන:

කෘෂිකර්ම උපදේශක නිළධාරියාගේ සහතිකය (අත්සන හා මුද්‍රාව සහිතව):

ඇමුණුම 6:

## කාබනික ගොවි පොරොන්දුව

——————————දිස්ත්‍රික්කයෙහි ——————————ගොවි ජන බල ප්‍රදේශයෙහි ග්‍රාමයෙහි පදිංචි—————————— වන මා 20 ———— වසරේ ——————————මස ————දින ——————————මෙමගින් දැනුම් දෙන පරිදිත

1. පරිසරයල පසල වගාවන්ල මාගේ පවුල හා සමාජයේ දිර්ඝ කාලීන පැවැත්මල මනා සෞඛ්‍යය සහ යහපැවැත්මට හේතු පාදක වන කෘත්‍රිම යෙදවුම් රහිතල කාබනික එළවළු බෝග නිෂ්පාදන ක්‍රියාවලියක් සහතික කිරීම සදහා මූලික කාබනික ප්‍රමිතීන් මම අනුගමනය කරමි. ප්‍රමිතින්ල සුදුසු යෙදවුම්ල ග්‍රාමීය කණ්ඩායම් කාර්ය භාරය සහ සාමාජික කාර්ය භාරය පිළිබද පත්‍රිකා ලබා ගතිමි.

2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාබනික සහතිකකරණ ක්‍රමවේද යටතේ සිදු කරනු ලබන ගොවිතැන් කටයුතු සදහා මම අනුමත නොකරන ලද යෙදවුම් ද්‍රව්‍ය (කෘත්‍රිම පලිබෝධනාශකල රසායනික පොහොරල ශාක වර්ධක හෝමෝන හා පත්‍රිකා අංක 7හි නිර්දේශිත ද්‍රව්‍ය වලින් බැහැර ද්‍රව්‍ය) සෘජුවම හෝ අනියම් අයුරින් භාවිතා නොකරමි.

3. අවුරුදු කාලසීමාවක් තුළදී මාගේ සියළුම්/ ගොවිතැන් කටයුතුල කාබනික ක්‍රමවේදයන් යටතට ගැනීමට බැදී සිටිමි.

4. මා විසින් භාවිතයට ගනු ලබන යෙදවුම් පිළිබදව සැකයක් මතු වූ විට ප්‍රාදේශීය කණ්ඩායමෙන් ඒ පිළිබදව විමසා දැන ගතිමි.

5. විටින් විට මාගේ ඉඩමේ පස්ල ජලය හා නිෂ්පාදනල ඇගයුම් කටයුතු සදහා පරීක්ෂාවන්ට ලබාදී මට එකග වෙමි.

6. අදාළ ප්‍රමිතින් සහ තාක්ෂණවේදයන් පිළිබද දැනුමල වර්ධනය සහ හුවමාරු කර ගැනීම පිණිස පවත්වනු ලබන රැස්වීම් සහ පුහුණු පංති සදහා සහභාගි වෙමි.

7. පස වැඩි දියුණු කර ගැනීම සදහා බෝග මාරුවල කොම්පෝස්ට් එකතු කිරීමල ආවරණ බෝග යොදා ගැනීමල කොළ පොහොර යෙදීම වැනි පරිසර තුලනය පවත්වා ගත හැකි ක්‍රම යොදා ද ගතිමි.

8. බෝග අස්වනු ලබා ගැනීමල ප්‍රවාහනය සහ විකිණීම සදහා අනුමත කරන ලද පිරිසිදු ඇසුරුම් පමණක් යොදා ගතිමි

9. අනුමත නොකරන ලද ද්‍රව්‍ය මිශ්‍ර වීම වැලැක්වීම සදහා සුදුසු ස්වාරක්ෂක කලාප සහ වෙනත් සුදුසු ක්‍රම යොදා ගතිමි

10. මම බෝග නිෂ්පාදන ක්‍රියාවලිය හරහා පරිසරය සුරකිමි.

11. සහතික කරන ලද බිම් වල කාබනික ප්‍රමිතීන්ට අනුකූලව නිපදවන බෝග පමණක් කාබනික නිෂ්පාදන ලෙස අලෙවි කරමි

12. ගොවිපළ ආශ්‍රිතව ගබඩාකරණයේදීල සැකසීමේදීල ප්‍රවාහණයේදී හා විකිණීමේදී කාබනික නොවන නිෂ්පාදන සමග මුසු නොකිරීමට සහතික වෙමි

13. නිෂ්පාදන වල සහතිකකරණ තත්වය පිළිබඳවල අපගේ ප්‍රාදේශීය කණ්ඩායමේ තීරණල පිළි ගැනීමට මම එකග වෙමි.

14. කණ්ඩායමේ ප්‍රතිපත්ති වලට අනුකූලවල අනෙකුත් සාමාජිකයින්ගේ ගොවිපළ ඇගයුම් සඳහා සහභාගි වෙමි.

15. මාගේ ගොවිපළෙහි සිදුවන ඉතා සුළු වූ හෝ අතපසු වීමකින් ප්‍රමිතීන්ට හානි සිදු වන්නේ නම්ල ඒ පිළිබඳව කණ්ඩායමේ සාමාජිකයින්ට දැනුම් දීමට පොරොන්දු වෙමි.

ඇතුළත් වීමේ පත්‍රිකාවේ සහ ගොවිපළ ඉතිහාස පත්‍රිකාවේ සඳහන් කරුණුල මාගේ දැනුමට අනුව සත්‍ය බවට මෙයින් දැනුම් දෙමි. ගොවිපළ ඇගයුම් කටයුතු වලදී ඇගයුම්කරුවන්ට සම්පූර්ණ සහයෝගය ලබාදෙන බවටත් මාගේ සහ මාගේ පවුලේ සාමාජිකයින්ගේ දැනුම අනුව සත්‍ය තොරතුරු ලබාදෙන බවටත් මා විසින් සිදු කරනු ලබන වෙනස්කම් පිළිබඳව වාර්තා තබා ගන්නා බවටත් තවදුරටත් මම මෙයින් පොරොන්දු වෙමි.

දිනය :

ස්ථානය :

නම :

අත්සන :

## ඇමුණුම 7:

# ග්‍රාමීය කණ්ඩායමේ රැස්වීම් පැවැත්වීමේ සහ පැමිණීමේ ආකෘති පත්‍රය

මාසිකව අවම වශයෙන් එක් වතාවක් හෝ ග්‍රාමීය කණ්ඩායම් සාමාජික හමුවක් පැවැත්විය යුතු අතර සෑම සාමාජිකයෙකුම මෙම රැස්වීම් වලට සහභාගි විය යුතුය. කන්නයකදී පවත්වනු ලබන රැස්වීම් වලින් අවම වශයෙන් 60 % ට වත් සහභාගි නොවන සාමාජිකයන්ගේ සාමාජිකත්වය අහෝසි වේ.

---

කාබනික ග්‍රාමීය කණ්ඩායමේ නම:

මුළු සාමාජිකයින් ගණන:

රැස්වීම පැවැත්වෙන දිනය සහ වේලාව:

ස්ථානය:

සාකච්ඡා කළ විශේෂ කරුණු සහ සැලසුම් (තිබේ නම්):

පැන නැගුණු ගැටළු හා තීරණ:

පෙර රැස්වීමෙන් පසු පරීක්ෂා කර ඇගයුමට ලක් කරන ලද ගොවිපළ සංඛ්‍යාව:
ඉදිරි මාසය සඳහා සැලසුම් කරන ඇගයුම් ගණන:
නව යෙදවුම් අනුමත කිරීම සඳහා යෝජනා:

සහභාගි වූ සාමාජිකයින්:

| අංකය | සාමාජිකයාගේ නම | අත්සන |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

මූලසූන දැරූ සාමාජිකයාගේ නම සහ අත්සන

## ඇමුණුම 8:

# ග්‍රාමීය කණ්ඩායමේ රැස්වීම් සඳහා සාමාජික සහභාගිත්වය

මාස 6 කදී පවත්වනු ලබන රැස්වීම් වලින් අවම වශයෙන් 60 % ට වත් සහභාගි නොවන සාමාජිකයන්ගේ සාමාජිකත්වය අහෝසි වේ.

වසර: කාල සීමාව: ජනවාරි සිට ජූනි / ජූලි සිට දෙසැම්බර්

| නම | සංකේත අංකය | ග්‍රාමීය කණ්ඩායමේ රැස්වීම | | | | | | පැමිණීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

# ඇමුණුම 9:

## ඇගයුම් කරුවන්ට උපදෙස්

ඇගයුම් ලාභී ගොවිපළ හිමිකරු මෙම ඇගයුම් කමිටුවේ සාමාජිකයෙක් නොවිය යුතුය. ඇගයුම සිදු කරන ග්‍රාමීය කණ්ඩායමේ සාමාජිකයින් අවම වශයෙන් දෙදෙනෙකුද්ල වෙනත් කණ්ඩායමකින් අවම වශයෙන් එක් සාමාජිකයෙකුද *ප්‍රාදේශීය කමිටුවේ නියෝජිතයෙකු/ කෘෂිකර්ම උපදේශක දල ඇගයුම් කමිටුවෙහි සාමාජිකයින් විය යුතුය. එක් ගොවිපළක් කන්නයකට දෙවතාවක් ඇගයීම හා සියළුම බිම් කොටස් වෙන වෙනම ඇගයීම සිදු කළ යුතුය.

*ප්‍රාදේශිය කමිටු නියෝජිතයා පළමු සහතිකකරණය හා සහතික අළුත් කරන ඇගයුමට අනිවාර්යයෙන් සහභාගි විය යුතුය. වෙනත් කණ්ඩායමක සාමාජිකයින් නොමැති විට ඇගයුම සිදු කරන කණ්ඩායමේ සාමාජිකයින් 3ක් හෝ වැඩි සංඛ්‍යාවක් සහභාගි කරවා ගත යුතුවේ.

මෙම ඇගයුමේදී නිරික්ෂනය කරන කරුණු කාබනික සහතිකකරණ ක්‍රමවේදයට අනුකූලද නැද්ද යන්න විස්තර කිරීම සඳහා පහත සඳහන් නිර්ණායක යොදා ගත හැක

1. නිරික්පණ මෙම ක්‍රමවේදයට අනුකූල නොවේ නම් හා එයින් කාබනික ප්‍රමිතීන් සඳහා බලපෑමක් නෙ-ාමැති නම්-.අවවාද. ලෙස සඳහන් කරන්න

2. නිරික්පණ මෙම ක්‍රමවේදයට අනුකූල නොවන නමුත් එයින් කාබනික ප්‍රමිතීන් සඳහා බලපෑමක් තිබේ නම්-.බලපෑමක් ඇත. ලෙස සඳහන් කරන්න

3. නිරික්පණ මෙම ක්‍රමවේදයට අනුකූල නොවේනම් සහ එයින් කාබනික ප්‍රමිතීන් බරපතල ලෙස කඩවේ නම්- .බරපතල. ලෙස සඳහන් කරන්න

4. නිරික්පණ මෙම ක්‍රමවේදයට සම්පූර්ණයෙන් එකග වේ නම්-.අනුකූල වේ. ලෙස සඳහන් කරන්න.

1 අවස්ථාව සඳහා අවවාද ලබා දෙන්න. පිට පිට පැවැත්වෙන ඇගයුම් 3 දී අවවාද දීමට සිදු වූ විට ඉන් කාබනික ප්‍රමිතීන් සඳහා බලපෑමක් ඇති විය හැකි ලෙස සැලකිය හැකි බැවින් එය සහතිකය ලබා දීමට බාධාවක් වේ. 2 සහ 3 අවස්ථා ඇතිවිට ගොවිපළ පවතින තත්වයල කාබනික දල පරිවර්තන ද යන්න සලකා බලාල ලියාපදිංචි අවස්ථාව දක්වා පහත දැමීමක්ල තාවකාලිකව නැවැත්වීමක් හෝ නෙරපීමක් සිදු කළ හැක.

4 අවස්ථාව සහතිකකරණය සඳහා ඉදිරිපත් කළ හැක

ඇමුණුම 10:

## ග්‍රාමීය කණ්ඩායමේ සාරාංශ පත්‍රය

(සහතිකකරණය කිරීමේ තීරණය අනුමත කර ගැනීම සඳහා ප්‍රාදේශීය කමිටුවට භාරදීම)
ජනවාරි-ජූනි/ ජූලි-දෙසැම්බර් කාල සීමාව තුළ සහතිකකරණය කළ යුතු ග්‍රාමීය ගොවි කණ්ඩායම් ලැයිස්තුව

වසර:

ග්‍රාමීය කණ්ඩායමේ සංකේත අංකය:

ග්‍රාමීය කණ්ඩායමේ නායකයාගේ/ නියෝජිතයාගේ නම:

ලිපිනය හා දුරකථන අංකය:

මුළු ගොවි සංඛ්‍යාව:

1. සහතිකකරණය සඳහා තත්ත්ව සම්පූර්ණ කර ඇති ගොවීන් ගණන:
   (අංක 1 ලැයිස්තුව)

2. පරිවර්තන කාලයේ පවතින තත්ත්වය ලබා ගත් ගොවීන් ගණන:
   (අංක 2 ලැයිස්තුව)

3. සම්බාධක/ දණ්ඩන පනවන ලද ගොවීන් ගණන:
   (අංක 3 ලැයිස්තුව)

## සහතිකකරණය පිළිබඳ තීරණ

__________________සංකේත අංකය දරණ _________________ග්‍රාමීය කණ්ඩායමෙහි සාමාජිකයින් වන අප අංක 1 ලැයිස්තුවේ සඳහන් සාමාජිකයින්ගේ කාබනික සහතිකකරණ තත්වය ළඟා කරගෙන ඇති බවත් ඒ සඳහා අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවත් පෞද්ගලිකවම සහ සාමූහිකව ප්‍රකාශ කරනු ලබන්නෙමු.

අංක 2 ලැයිස්තුවේ සඳහන් සාමාජිකයින් කාබනික පරිවර්තන තත්වය ලබාගෙන ඇති බවත් අප පෞද්ගලිකවම සහ සාමූහිකව ප්‍රකාශ කරනු ලබන්නෙමු.

මෙම සහතිකකරණ තීරණ අනුමත කර දෙන මෙන් කාරුණිකව ඉල්ලමු. අදාළ ඇගයුම් පත්‍ර නැවත සමීක්ෂණය සඳහා ලබාදිය හැක.

ප්‍රාදේශීය කමිටුවෙන් දෙනු ලබන තීරණය පිළි ගැනීමට අප කණ්ඩායම බැඳී සිටිමු.

ග්‍රාමීය කණ්ඩායම් නියෝජිතයාගේ අත්සන: දිනය:

ප්‍රාදේශීය කමිටුවේ තීරණය

සහතිකකරණ තීරණය අනුමත කරන ලදී.

සහතිකරණය සඳහා දෙනු ලබන සංකේතය:

සහතිකකරණ තීරණය අනුමත නොකිරීමට හේතු:

1.

2.

3.

4.

5.

අත්සන: දිනය:

ප්‍රාදේශීය කමිටුවේ සහතිකකරණ නිළධාරියා

අභියාචනය කිරීමේ අයිතිය

සහතිකකරණ තීරණය අනුමත නොකිරීමට ප්‍රාදේශීය කමිටුව මගින් තීරණය කර ඇත්නම් තීරණය ගත් දිනයේ සිට සති 2ක් තුළ ජාතික කමිටුවට අභියාචනය කිරීමේ අයිතිය ග්‍රාමීය කමිටුවට ඇත.

## ඇමුණුම 11:

### කාබනික පොරොන්දු කඩ කිරීම පිළිබඳව ගනු ලබන ක්‍රියා මාර්ග (සම්බාධක/දණ්ඩන)

සාමාජිකයින්ට සම්බාධක පැනවීම ග්‍රාමීය කණ්ඩායම එක්ව හෝ ග්‍රාමීය කණ්ඩායම මගින් පත් කරන ලද කමිටුවක් මගින් සිදු කරයි

| අවස්ථාව | සම්බාධකය/ දණ්ඩනය |
|---|---|
| • දැනුවත් කිරීමේ වැඩසටහනකට නොපැමිණීම<br>• නිෂ්පාදන ක්‍රමවේදයේ අඩුපාඩු | අවවාද කිරීම |
| • ප්‍රමිතීන් සුළු වශයෙන් කඩ කිරීම<br>• එකම වරද සඳහා .අවවාද. 2ට වැඩි සංඛ්‍යාවක් ඇගයුම් පතෙහි සටහන් වීම<br>• අනුමත කළ කොන්දේසි වලට ප්‍රතිචාර නොදැක්වීම | අවවාද කිරීම |
| • ප්‍රමිතීන් සුළු වශයෙන් දෙවතාවකට වැඩියෙන් උල්ලංඝනය කිරීම<br>• නිෂ්පාදනයේ කාබනික තත්වය නැති නොවන නමුත් ප්‍රමිතීන් පැහැදිලිව උල්ලංඝනය කර තිබීම | ගොවියා විසින් නිවැරදි ක්‍රියා මාර්ග ගන්නා තුරු ස්ථිර කාලයක් සඳහා සහතිකකරණය නැවැත්වීම |
| • ප්‍රමිතීන් පැහැදිලිව උල්ලංඝනය කර තිබීම නිසා නිෂ්පාදනයේ කාබනික තත්වය නැති වීම | අවුරුද්දක කාල සීමාවක් සඳහා සහතිකකරණය නැවැත්වීම<br>ගොවියා නැවත පරිවර්තිත කාලයේ පවතින වගාවක තත්වයට පත්වේ |
| • දෙවතාවකට වඩා ප්‍රමිතීන් උල්ලංඝනය කිරීම<br>• පැහැදිලි වංචාවක් සිදු කිරීම<br>• ඇගයුම පරීක්ෂාව ඕනෑකමින් නැවැත්වීම<br>• වැඩි විස්තර සඳහා කළ ලිඛිත ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම | සහකතිකකරණ ක්‍රමවේදයෙන් ඉවත් කිරීම<br>සාමාජිකත්වය ස්ථිරවම හෝ නම් කරන ලද කාලසීමාවක් සඳහා අහිමි කිරීම |

# අභියාචනය කිරීමේ අයිතිය

සම්බාධක පනවා සති 2ක් ඇතුළත ප්‍රාදේශීය කමිටුවට අභියාචනය කිරීමේ අයිතිය ගොවියාට ඇත.